සුනිල් මාධව ප්‍රේමතිලක

සැබෑ මැයි දිනය තිබෙන්නේ ධනපති රටවල්වල යි

අද වන විට මැයි දිනය කම්කරුවන්ගේ දිනයක් ද? තුට්ටු දෙකේ දේශපාලකයන්ගේ දිනයක් ද? යන්න සිතිය යුතු වෙනවා.

කම්කරුවා වෙනුවෙන් ඇති වූ බිහි වූ මැයි දිනය අද තියෙන්නෙ කම්කරුවා වෙනුවෙන් ද? කියන එක මැයි දින පෙළපාලි දිහා බලපුවා ම දකින්න පුළුවන්. මීට දශක දෙකක පමණ කාලයක සිට මැයි දිනය යොදා ගන්නෙ එක එක දේශපාලන පක්ෂ උන්ගෙ ශක්තිය පෙන්නන්න විතරයි.

මම ලෝකයේ ඇතැම් රටවල මැයි දින දැකලා තියෙනවා. ඒ වගේ යම් විනයක් කියලා දෙයක් තිබුණා. අපේ රටේ මැයි දිනය කියලා කියන්නෙ නිකම් කසිප්පුකාරයන්ගෙ දිනයක් විතරයි. මැයි දින රැළිවල මැයි දින පෙළපාලිවල අපි ඇස් දෙකට දැකලා තියෙනවා. රුපියල් දහයට කසිප්පු පැකට් විකුණන්න තියෙනවා. ඕක තමා අපේ රටේ මැයි දිනය කියන්නේ. මට මතකයි අපි පොඩි කාලේ, ඒ කාලේ මම මැයි පෙළපාලිවල ගිහින් තියෙනවා. හයිලෙවල් පාර දිගේ විශේෂයෙන් ම සමසමාජ මැයි දිනය, ඉතා බලගතු ශක්තිමත් මැයි දිනයක් ඒක. 'අපි යන්නන් ගොල්ෆේස්. එන්න යන්න ගොල්ෆේස්' කියල ගිය කාලයක් තිබ්බා. එදා අද වගේ නෙමෙයි මොන තත්වයක් තිබ්බත් කම්කරු සහභාගීත්වයක් තිබුණා. වරායෙ කම්කරුවෝ වෙනත් ආයතනවල කම්කරුවෝ තමයි බහුතරයක් ගියේ ඒ වගේ.

අද වෙලා තියෙන්නෙ හැම පක්ෂයක්ම බස් දාලා, බුරියානි පැකට් දීලා, එහෙම නැත්නම් රුපියල් සීයක් දීලා මොකක් හරි මිනිහෙක්ව ගෙන්නලා පෙළපාලිය, රැස්වීම තර කර ගැනීමේ තරඟයක් අද තියෙන්නේ.

මට මතකයි මම 1976 විතර නැගෙනහිර ජර්මනියේ මැයි දිනයක් බලන්න ගියා. ඉතාම ගාම්භීර දේවල් ඒකෙ තිබුණා. යුද ටැංකි ද, එක එක ජාතියෙ තුවක්කු ද, මහා ජනකායක් එක්ක, විශාල හමුදාවක් හිටියා. මොකද ඒ අයට අවශ්‍ය හමුදාවේ ශක්තිය පෙන්වන්න. මොකද බටහිර ජර්මනියට සහ අනෙක් ධනපති රටවල්වලට පෙන්වන්න ඕන කොමියුනිස්ට් පැත්තෙ තියෙන ශක්තිය. ඒක පෙන්නන්න දරන උත්සාහයක් පමණක් ඒක. මම හිතනව සැබෑ මැයි දින තියෙන්නෙ දියුණු ධනපති රටවල්වල කියලා. එතැන තමයි සැබෑ සේවකයෝ ඒ අයගෙ ස්වයං කැමැත්තෙන් ඇවිල්ලා අපි මේක කරමු කියලා එළියට බහින්නේ. දැන් වසර දෙක තීරයකට කලින් මම ස්විඩනයෙ මැයි දිනයක් දැක්කා ස්ටොක්හෝම් අගනුවර. එතැන මට තේරුණා දේශපාලකයොත් නෑ, දේශපාලනයට සම්බන්ධ කවුරුත් නැහැ. එතැන හිටියෙ සේවකයෝ. ඉතාම ආශාවෙන් ඒ මිනිස්සු කරපු වැඩක් ඒක. ඒ නිසාම මං හිතනවා ධනපති රටවල් මැයි දිනය සැබෑ මැයි දිනයක් වෙනවා අනෙක් කොමියුනිස්ට් රටවල් එක්ක ගත්තහම.

ලංකාවේ මැයි දිනය ගත්තහම විශාලම සෙනඟ ආපු මැයි දිනය තමයි 1970 මැයි දිනය. සිරිමා, එන්.එම්, දොස්තර වික්‍රමසිංහ, පිලිප් ගුණවර්ධන ඔක්කොම එකට ගිය මැයි දිනය. මං හිතන්නේ ලංකාවේ මෙතෙක් පැවති ඉහළම මැයි දිනය ඒක. මහා ජනතා සහභාගීත්වයක් තිබුණා. මම ඒ දවස්වල ලේක්හවුස් එකේ වැඩ කළේ. මම තරුණ පොඩි කොල්ලෙක් වුණත්, ඒ දවස්වල මටයි පැවරුණේ ඒ මැයි පෙළපාලිය ගැන ලියන්න. මම මාධ්‍යවේදියෙක් හැටියට එතැනට ගියත් මටත් පෙළපාලියට යන්න හිතෙන ගැම්මක් තිබුණා. මටත් ඉබේම පෙළපාලියෙ යැවුණා. එහෙම ගිහින් මම ඒ ලිපිය ලිව්වේ.

මම හිටපු පත්තරේ ප්‍රවෘත්ති කර්තෘ හිටියේ ඒමන් කාරියකරවන, ඒමන් රංජිත් විජේවර්ධනගෙන් විශේෂ අවසරයක් අරන් තියෙනවා මේක දාන්න ද එපා ද කියලා. රංජිත් දාන්න කියලා, කියලා තියෙනවා. මොකද මම ඒ ලිපිය ලීවේ මට දැනුණ හිතුණ හැම දෙයක්ම ඇතුළත් කරලා. මට ඒකට විජේවර්ධන සම්මානය පවා ලැබුණා. මහා ගාම්භීර මැයි පෙළපාලියක් ඒක.

මෑත ඉතිහාසයෙ ඉතාමත්ම වටිනා සහ විනයක් සහිතව මෙන්න මැයි දිනය කියන එක පෙන්නුවේ ජනතා විමුක්ති පෙරමුණ. ඒක පෙන්නපු එකෙන් ම තමයි ජනතා විමුක්ති පෙරමුණට මහා විනාශයක් වුණේ. 1983 මැයි දිනය දැකලා තමයි ජේ.ආර් ජයවර්ධන බය වුණේ. අනිවාර්යයෙන්ම මුන් බලයට එනවා කියන එක. මෙච්චර ජනතාවක් ජනතා විමුක්ති පෙරමුණ එක්ක ඉන්නවයි කියන එක. ඒ බයවෙලා තමයි ආණ්ඩුකාරයෝ නවයක් දහයකගේ මිනී ආවහම ඒක ජවිපෙ පිට දාලා ජේ.ආර්.ගෙ මැරයෝ දාල ජවිපෙ තහනම් කරලා මර්දනය කරලා ජවිපෙ විනාශ කළේ. ඒ විනාශයෙන් ජවිපෙ විතරක් නෙමෙයි, මේ රටේ 75,000 පමණ තරුණ තරුණියෝ මැරුණා. ජේ.ආර්ගේ දෝහීකමක් ඒක. ජේ.ආර් බය වුණා ජවිපෙ මැයි දිනයට.



ශ්‍රී ලංකාව පළමු මැයි දින පෙළපාලිය 1953 වසරෙ ගත් ඡායාරූපයක්

අද වුණත් පිළිවෙළකට, ලස්සනට මැයි දිනය සමරන්නෙ ජනතා විමුක්ති පෙරමුණ. ඒකට හේතුව එතන විනයක් තියෙනවා. එතැන කසිප්පු ගහපු එවුන් නැහැ. බත් පැකට් එකට, රුපියල් සීයට එන එවුන් නැහැ. අනෙක් පක්ෂ සහ මැයි පෙළපාලි ගත්තොත් අද කම්කරුවොට දේශපාලන පක්ෂවල අතකොළු බවට පත්වෙලා තියෙනවා. ඒක කම්කරුවන්ගෙ වරදක් නෙමෙයි. දේශපාලකයන්ගෙ වරදක්. උන් කම්කරුවන්ව බිලී බාගෙන තියෙනවා. අපි හොඳට දන්න කාරණයක් තියෙනවා. එක ආණ්ඩුවක් ආවහම යම් යම් තැන්වලට රැකියාවලට කොටසක් එනවා. ඒ ආණ්ඩුව ගිය ගමන් ඒ අය පන්නලා අලුත් උන්ගෙ කට්ටිය දා ගන්නවා. රැකියාව පිළිබඳව ඔය වගේ ප්‍රශ්නයක් අපේ රටේ තියෙන්නෙ. එතකොට අනිවාර්යයෙන් ම රැකියාව සම්බන්ධයෙන් කම්කරුවොට බිලී බා ගන්න තත්වයක් අපේ රටේ දේශපාලන පක්ෂවලට තියෙනවා.

අපේ කම්කරු ජනතාව මීට වැඩිය බුද්ධිමත් විය යුතුයි. අපි ඇයි මේ බෙන්ස්වල යන, පැජරෝවල යන දේශපාලකයන්ගෙ අතකොළු බවට පත්වෙලා මේ පෙළපාලි යන්නෙ? කසිප්පු බීලා හරි අව්වෙ වේලි වේලි ඒක කරන්නෙ ඇයි? ඇයි අපි උන්ගේ බුරියානි පැකට් එකට මැයි පෙළපාලිය පාවා දෙන්නේ? ඇයි අපි රුපියල් සීයට දේශපාලකයන්ට මැයි පෙළපාලිය පාවා දෙන්නේ? ඇයි දේශපාලන පක්ෂවලින් බස් සිය ගණන් දාන්නේ අපට එන්න? කියා සිතිය යුතුයි.

මේක අපේ හදවතේ කැමැත්තෙන් ආ යුතු ගමනක්. ඒක තේරුම් ගත යුතුයි අපේ කම්කරු ජනතාව. එය තේරුම් නොගන්නා තාක්කල් මැයි දිනය කියන්නේ නිකම් බොරු පුස්සක් විතරයි. මැයි දිනය සැමරිය යුත්තෙ දේශපාලන බුද්ධියකින් යුතුව. එකේ මුල් තැන ගන්න ඕන වෘත්තීය සමිති. ඒත් දැන් වෙලා තියෙන ලොකුම බෙදවාචකය වෘත්තීය සමිති තියෙන්නෙත් දේශපාලකයන්ගෙ සාක්කුවේ.

ඒකෙන් නියම විදිහට මැයි දිනය සමරන්න වෙන්නෙ නැහැ. කාන්තා දින වැනි ඒවා වගේ කම්කරු දිනයත් දැන් එක දිනයක් විතරයි. එකම දේ දේශපාලන පක්ෂවල බලය පෙන්නන්න කොඩි උස්සගෙන කෑ කෝ ගහගෙන බස්වී දාගෙන පෙළපාලි යනවා. අන්තිමට දේශපාලකයෝ එකෙක් දෙන්නෙක් පම්පෝරි ගහනවා අහගෙන ඉඳලා ගෙදර යනවා.

එහෙන් එදා බණ්ඩාරනායක අගමැති කාලේ ලංකා සමසමාජ පක්ෂයට හැකි වුණා විනාඩි දහයක් ඇතුළත මුළු රටම අඩපණ කරන්න වැඩ වර්ජනයකින්. ඒ වගේ ශක්තියක් තිබුණා වෘත්තීය සමිතිවලට. අද ඒ දේ නෑ. කම්කරු ජනතාව මර්දනය කරන මොන පීඩාකාරී නීතියක් රීතියක් දැම්මත් ඒකට විරුද්ධව පොදුවේ කම්කරු ජනතාව නැගී සිටින තත්වයක් අද නෑ. මොකද මේ ආණ්ඩුවෙන් ඒ මර්දනකාරී කම්කරු නීති දැම්මොත් මේ ආණ්ඩුවේ වෘත්තීය සමිති ඒකට විරුද්ධව නැගී සිටින්නෙ නෑ. මොකද වෘත්තීය සමිති නායකයො ඉන්නේ දේශපාලකයන්ගෙ සාක්කුවේ. උන්ට ආණ්ඩුවෙන් සල්ලි ලැබෙනවා. යම් යම් වරප්‍රසාද ලැබෙනවා. ඔන්න ඕකයි අද තියෙන තත්වය. මං මේකට ජේ.වී.පී ගාවගන්නේ නැහැ. අනික් වෘත්තීය සමිති ගත්තොත් උන් වේදිකාවල, රැස්වීම්වල කම්කරුවොට සමඟ සාකච්ඡා කරලා හවසට දේශපාලකයෝ එක්ක ලොකු ලොකු හෝටල්වල විස්කි බොනවා.

ඕකෙන් තමයි හෙණ ගහලා තියෙන්නෙ අපේ කම්කරු ව්‍යාපාරයට කම්කරුවොට තමන්ගෙ අයිතිවාසිකම් දිනාගන්න ඕනනම් දේශපාලන පක්ෂ භේදයකින් තොරව වැඩ කරන ජනතාව හැටියට එකතු විය යුතුයි. නැත්නම් කම්කරුවන් වන අපට කවමදාවත් යමක් දිනාගන්න ලැබෙන්නෙ නැහැ. ඒ සඳහා දේශපාලන පක්ෂවලින් තොර කම්කරු නායකත්වයක් අවශ්‍යයයි. එදා ඒ.ඊ. ගුණසිංහ එහෙම හිටියා. බාල තම්පෝත් ඒ වගේමයි. අද ඒ තත්වය නැහැ. වැඩ කරන ජනතාව එය තේරුම් ගත යුතුයි. දේශපාලන පක්ෂවල නායකයො අපේ වෘත්තීය සමිතිය මෙහෙයවනව නම් අපි උන්ව පන්නන්න ඕන.

■